නුවරඑළිය මහා නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 23 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 09 දින කොමසාරිස්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය තුලදී ආධාර වශයෙන් ලැබී තිබුණු බටහිර ඖෂධ වර්ග 08ක වටිනාකම ගණනයකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුලදී සභාව වෙත අවස්ථා 04කදී ත්‍යාග වශයෙන් ලැබී ඇති රු.284,025ක් ආදායමට නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ). හිඟ ගවමස් කඩකුලී නඩුවකින් 2014 හා 2015 වර්ෂවලදී අවස්ථා 06කදී ලැබූ රු.300,000ක මුදල තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීම නිසා ආපසු ගෙවිය යුතු තැන්පත් සහ ණය ගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවී ඇති රු.1,622,471ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හා වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.992,624ක් වටිනා ජංගම වැසිකිළි 09ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03ක එකතුව රු.19,021,019ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.17,806,983ක් වී තිබුණි.

1.3.3 නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ). | මහා නගර සහා ආඥා පනත | | |
| | 40 (1) ඊ වගන්තිය | | 1985 සිට 1995 දක්වා අවස්ථා 30කදී විෂයභාර අමාත්‍යවරයාගේ සහ ජනාධිපතිවරයාගේ අනුමැතියකින් තොරව බදු දුන් ඉඩම් පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| | 237 (1) වගන්තිය | | 2000 වර්ෂයේ වත්කම් ක්සේරුවෙන් පසු වාර්ෂික වටිනාකම් බලපැවැත්වෙන භෞතික වෙනස්කම් සිදුකරන අවස්ථාවලදී නව තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | | (i) 104 | 2015 වර්ෂයේ අවසන් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී අනාවරණය වී ඇති රු.423,631ක මුදල් ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | | (ii) 371 (2) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 19කදී ලබාගත් රු.2,226,476ක අත්තිකාරම් 2016 ජනවාරි 20 දින වන විටද පියවා නොතිබුණි. |
| | | (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) හා 2011 දෙසැම්බර් 09 දිනැති අංක 453 සහ 2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | 2015 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයක් විය. |
| | | (iv) 396 (ඇ) | අවසානයට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2013 ජූනි සිට 2015 පෙබරවාරි දක්වා නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06ක් කල් ඉකුත් වූ රු.139,571ක් වටිනා චෙක්පත් 38ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | | (i) VIII වැනි පරිච්ඡේදය 10.1 වගන්තිය | ආයතන ප්‍රධානියාගේ අනුමැතියකින් තොරව නිවාඩු දින වැටුප් සඳහා අවස්ථා 02කදී රු.18,376ක් ගෙවා තිබුණි. |
| | | (ii) 3 ඡේදය | සමාලෝචිත වර්ෂයේ සභාවේ අංශ 04ක 338 දෙනෙකුගේ අතිරික්තයක් පවතිද්දී රු.8,298,955ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (iii) xxiv පරිච්ඡේදය 4වන වගන්තිය | විශ්‍රාමගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු රු.112,193ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>සේවය හැරගිය නිලධාරීන් 34 දෙනෙක් හා සේවයෙන් පහකළ නිලධාරීන් 05 දෙනෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු.75,000ක් හා රු.461,623ක් අයකරගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.102,583,782ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.90,844,014ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,739,768ක වර්ධනයක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

අතිරික්තයේ රු.11,739,768ක වැඩිවීම කෙරෙහි ආදායම් විෂයන් 05ක වැඩිවීම සහ වියදම් විෂයන් 03ක අඩුවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

2.3. ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.
----------------------------------------

නාගරික කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015 වර්ෂයේ බිල්කිරීම් | අයකළ යුතු මුළු මුදල | වර්ෂයේ අයකිරීම් බිල්කිරීම්වලින් | හිඟයෙන් | 2015.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 64,173,174 | 40,885,552 | 105,058,726 | 21,070,485 | 15,320,750 | 67,530,859 |
| බදු කුලී | 57,601,492 | 35,582,446 | 93,183,938 | 24,738,254 | 26,698,197 | 41,585,486 |
| බලපත්‍ර ගාස්තු | 782,500 | 13,670,580 | 14,453,080 | 13,655,580 | 15,000 | 782,500 |
| ජල ගාස්තු | 25,023,319 | 37,160,811 | 62,184,130 | 22,574,573 | 13,315,373 | 26,294,183 |

2.3.2 වරිපනම් බදු
-------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මහා නගර සභා ආඥාපනතේ 237(1) උප වගන්තිය ප්‍රකාරව කිසියම් වත්කමක තක්සේරුවෙන් පසු එම වත්කමේ වාර්ෂික වටිනාකමට බලපෑමක් වන ලෙස එහි භෞතික වෙනස්කිරීම් කරන අවස්ථාවක මහා නගර සභාව ඒ සඳහා නව තක්සේරුවක් සිදුකර එළඹෙන මාසයේ පළමු වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකිරීම් කළ යුතු වුවද, නගර සභාව 2001 වසරින් පසු වසර 07කට අධික කාලයක් සිදුකර ඇති ඉදිකිරීම් සඳහා වරිපනම් බදු ප්‍රතිශෝධනයට කටයුතු කර නොතිබුණි.

(ආ). විගණන නියැදි පරීක්ෂණ අනුව මහා පරිමාණ ඉදිකිරීම් 05ක් අනුකූලතා සහතික නොමැතිව මෙහෙයුම් කටයුතු අරඹා තිබුණද, ඉදිකිරීමට පෙර පැවති භූමියේ වටිනාකම මත ඉතා සුළු වරිපනම් ප්‍රමාණයක් අයකරමින් පැවතුණි.

(ඇ). මහා නගර සභා ආඥා පනතේ 252 (3) උප වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු මුදල් අතහැර දැමීමට එම මුදල නොසැළකිය යුතු තරම් හෝ එම ගෙවනු ලබන තැනැත්තාගේ දිළඳු බව මත යම් වරිපනම් බද්දක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සභා සම්මුතියක් මත ඉවත් කළ හැකි වුවත් නුවරඑළිය හෝටලයක රු.73,320ක වරෙන්තු ගාස්තු ආදායම් පරීක්ෂකගේ නිර්දේශය හා ගණකාධිකාරිවරයාගේ 2010 පෙබරවාරි 24 දිනැති අනුමැතිය ප්‍රකාරව ඉවත්කිරීමට කටයුතු කර තිබුණි.

(ඈ). හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 242 උපවගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.3 ජල ගාස්තු

-------------

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) සභාවේ ලේඛන අනුව 2007 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුළ විසන්ධි කළ ජල සේවාවන් 187ක් වූ අතර, එම ජල පාරිභෝගිකයින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.2,516,535ක හිඟ මුදලක් අයවීමට පැවතුණි. තවද, එම පාරිභෝගිකයින් අනවසර ජල සම්බන්ධතා ලබාගෙන තිබේද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු රු.26,294,183ක් වූ අතර එම මුදල අයකර ගැනීමට මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ අත්සන් කළ ගිවිසුමේ 4වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.4 වාහන නැවතුම් ගාස්තු

-------------------------

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

i. සභා බල ප්‍රදේශය තුළ වාහන නතර කිරීම් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමකින් තොරව ගාස්තු අයකරමින් පැවතුණි.

ii. රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම සඳහා සේවකයින් 13 දෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර ඔවුන්ට නිල ඇඳුම් ලබාදී නොතිබුණි.

iii. විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව ගාස්තු අයකිරීමේ කටයුතු පිළිබද අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි.

2.3.5 ග්‍රෙගරි පාපැදි ව්‍යාපෘති.

------------------------

ග්‍රෙගරි උද්‍යානය තුළ පවත්වාගෙන ගිය පාපැදි කුලියට ලබාදීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සභාව විසින් දැඩි කොන්දේසි පැනවීම නිසා මෙම වසර තුළද ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමෙන් සභාවට රුපියල් මිලියන 05කට අධික ආදායමක් අහිමිවී තිබුණි.

2.3.6 ඉඩම් බදු මුදල් කපාහැරීම

------------------------------

ක්‍රීඩා සමාජයකට බදුදී ඇති අක්කර 29 - රූඩ් 01- පර්චස් 16.2 ක ඉඩම වෙනුවෙන් 1991 සිට 2009 දක්වා අයවිය යුතු රු.3,906,000ක ඉඩම් බදු මුදලක් කපාහැරීමට 2015 ඔක්තෝබර් 08 දින, විශේෂ මුදල් හා ස්ථාවර කාරක සභාවේ අංක 04 දරන තීරණය මගින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමට නිර්දේශ කර තිබුණි. මහා නගර සභා ආඥා පනතේ 266 වගන්තියට පටහැනිව මෙම තීරණය ගෙන තිබුණි.

2.3.7 වෙනත් ආදායම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. මස්කඩ, ඉරිදා පොළ මාළු ලැලි, ආපන ශාලා, පොදු වැසිකිළි සහ ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා මිලගණන් කැඳවීමේදී අවම ලංසුව තීරණය කර තිබුණද, මිලකැඳවීමේ පුවත්පත් දැන්වීම්වල එම ලංසු මුදල දක්වා නොතිබුණි.

ii. විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු අනුව අවස්ථා 05කට අදාළ ගිවිසුම්වලට සභාව වෙනුවෙන් කිසිවෙකු අත්සන් කර නොතිබුණි.

2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.758,748ක් සහ මුද්දර ගාස්තු රු.16,636,323ක් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාවේ භාවිතය සඳහා රු.1,054,440ක් වටිනා Sound System and Conference System මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ආ). මහා නගර සභාවට අයත් අක්කර 06 - රූඩ් 01 - පර්චස් 15ක ඉඩමක් පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලාවක් සඳහා වසර 33ක කාලයකට 1982 ජූලි 31 දින බදුදී තිබුණු අතර එහි බදු කාලය 2015 ජූලි 31 දිනෙන් අවසන්වී තිබුණි. එසේ වුවද, ගිවිසුම් ප්‍රකාරව අදාළ දේපළ සභාව වෙත පවරා ගැනීමට හෝ නව තක්සේරුවක් යටතේ නව බදු ගිවිසුමකට එළඹීමට සභාව 2016 මාර්තු වන විටද කටයුතු කර නොතිබුණි.

3.3. ගබඩා පාලනය

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මිලදීගත් තොග ගබඩාවට ලැබීමෙන් අනතුරුව නිකුත් කරන තොග ලැබීමේ තුන්ඩුවල (GRN) තොග ලේඛන පිටු අංකය සඳහන් නොකිරීම නිසා අවස්ථා 06කදී මිලදී ගන්නා ලද රු.536,446ක් තොග ලේඛනවලට ඇතුළත් කළ බවට තහවුරු කරගත නොහැකි විය.

(ආ). අවස්ථා 08කදී මිලදීගත් රු.546,561ක් වටිනා තොග, තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) මහා නගර සභාවේ මාතෘ සායනය සඳහා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු යකඩ ෆෝලේට් ඖෂධ පෙති 178,000ක් සමාලෝචිත වර්ෂය තුලදී කල් ඉකුත්වී පැවතුණි.

(ඈ). 2015 භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 143කට අදාළ අයිතම 325ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව වගකිව යුත්තන් තීරණයකර අවශ්‍ය කටයුතු කිරීමට හෝ පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). සභාවේ අංශ කීපයක කාර්යාලීය බඩු හා උපකරණ, වාහන හා වාහන අමතර කොටස් අතිරික්තතාවයක් නිරීක්ෂණය වූ අතර ඒවා පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගණුදෙනු

------------------

2015 ජූලි 08 දින රු.3,135,510ක් වටිනා ටයර් 64ක් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට පටහැනි ලෙස මිලගණන් 03ක් පමණක් කැඳවා ලබාගෙන තිබුණි. එසේ මිලදීගත් මිලගණන්, විගණනය විසින් වෙළඳපොළින් ලබාගත් මිලගණන් හා සැසඳීමේදී සභාව විසින් රු.959,482ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති.

-------------------

ගොල්ෆ් වීව් වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මූලික සැලසුම් සහ ඇස්තමේන්තු වෙනුවෙන් උපදේශන සමාගමක් වෙත රු.3,000,000ක් ගෙවා වසර 09ක කාලයක් ගතවී තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 05ක සියයට 17සිට සියයට 86 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 10 සිට සියයට 60 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

(අ). නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) සභාව සතු වාහන 05ක් සහ වත්කම් වර්ග 02ක් වසර 05කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ii) 2011 වර්ෂයේදී මිලදීගත් රු.448,500ක් වටිනා වැහි කබා 230ක් සහ එම වර්ෂයේදී ග්‍රෙගරි වැව අලංකරණය සඳහා ලබා ගත් රු.744,750ක් වටිනා විදුලි බල්බ 135ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව ගබඩාවේ පැවතුණි.

(ආ). බාහිර පාර්ශවයන්ට ලබාදී ඇති වත්කම්

කර්මාන්ත ගබඩාවේ පැවති රු.50,000ක් වටිනා 14'x8' ප්‍රමාණයේ "සෙප්ට්‍රික්" වර්ගයේ වතුර ටැංකියක් නුවරඑළිය මැතිවරණ කාර්යාලයට ලබාදී තිබුණි. මේ සඳහා නිකුත් නියෝගයක් නොමැති බැවින් පොත්වල ශේෂයක් ලෙස සටහන් කර තිබුණි.

5. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ආදායම් පරිපාලනය.

(ආ). වත්කම් කළමනාකරණය

(ඇ). ණයගැති හා ණයහිමි පාලනය

(ඈ). තොග පාලනය.